අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10.2	සමාලෝචික වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	2022.12.31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ පැවති බැංකු ගිණුම කැබිනට් අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.	
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එලඹීම.	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කරතිබීම	අනුකූල වේ		
13.2	පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අදාළ වාර්තා නියමිත දිනට සකස් කිරීමට නොහැකි වීම	මේ වන විට අදාළ වාර්තා සකස් කරමින් පවතී

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ		ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත පුහුණු අවස්ථා ලබා නොදුනි. ඉදිරි කාලය තුලදී ලබාදීමට අපේක්ෂා කෙරේ.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම I

(විගණකාධිපතිවරයාගේ වාර්තාව)

2223

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
27 APR 2023
ගිණුම් ශාඛාව
අංක. 35, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

මගේ අංකය எனது இல. My No.	ඩබ්ලිව්ඒඑස්/ඩී/එම්ඩබ්ලිව්එස්/එෆ්ඒ/2022	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023 අප්‍රේල් 26 දින

CFO නගර සැලැස්ම ජලසම්පාදන අමාත්‍යාංශය
27 APR 2023
ගිණුම් ශාඛාව
අංක. 35, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල

ලේකම්
ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත:- අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

27 APR 2023

මගේ අංකය எனது இல. My No. } ඩබ්ලිව්එස්/ඩී/එම්ඩබ්ලිව්එස්/එස්ඒ/2022 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 අප්‍රේල් 26 දින

ලේකම්
ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

ශීර්ෂය 166 - ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 166 - ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන, ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ආදායම් නොවන ලැබීම්

2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 හි 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා, අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති තොරතුරු සමඟ එකඟ වන බවට සහතික විය යුතු වුවත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල ඇතුලත් සමාලෝචිත වර්ෂයට අදාල තැන්පතු ලැබීම් රු.1,712,060 ක් සහ තැන්පතු ගෙවීම් රු.1,589,597 ක් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයෙහි පිළිවෙලින් රු.1,482,085 ක් සහ රු.1,478,947 ක් ලෙස සටහන් කර තිබුණි. ඒ අනුව තැන්පතු ලැබීම් සහ ගෙවීම් එකතුව රු.340,625 ක් අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි සටහන් වී තිබුණි.

1.6.2 පුනරාවර්තන වියදම්

2022 ඔක්තෝම්බර් 17 දිනැති පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීමේ බල අංක 134 ප්‍රකාරව අංක 166-01-01-1102/11 දරන වැය විෂය සඳහා රු.500,000 ක පරිපූරක ඇස්තමේන්තු වෙන් කර තිබුණද, එම අගය මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ 2(ii) වියදම් ප්‍රකාශයෙහි සටහන් කර නොතිබුණි.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂය තුළ වාහන 02 කට හා කාර්යාල උපකරණ 03 කට සිදුවී තිබූ හානි හේතුවෙන් රජයට වී තිබුණු එකතුව රු.1,965,742 ක පාඩුව සහ තවදුරටත් අය නොවී පැවති ශේෂයන් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (i) හා (ii) ඡේද යටතේ දක්වා නොතිබුණි.

1.6.4 බැංකු ගිණුම් මෙහෙයවීම

2022 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ අංක 7042707 දරණ බැංකු ගිණුමේ ශේෂය රු.13,232,474 ක් වී තිබුණු අතර එම අගය මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (viii) හි බැංකු ගිණුම් පිළිබඳ තත්ත්ව වාර්තාවේ ඇතුළත්කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව අනපේක්ෂිත තත්ත්වයන් මත ඇතිවන අත්‍යාවශ්‍ය වියදම් වෙනුවෙන් පමණක් පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අයදුම් කළයුතු වුවද, ඒ පිළිබඳ නොසලකා පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙන්කර ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැය විෂයන් 08 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු.2,740,000 ක් වූ මුළු පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර පැවති අතර වැය විෂයන් 07 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් ඉතිරිවීම් සියයට 17 සිට සියයට 93 ක් දක්වා පරාසයක පැවතුනි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුව සකසුරුවම්කම සහ කාර්යක්ෂමතාව පිළිබඳ අවධානය යොමු නොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් වැය විෂයන් 79 ක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් සියයට 12 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. ඉන් වැය විෂයයන් 16 ක් සඳහා වෙන්කළ එකතුව රු.83,698,829 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ඡේදයෙහි දක්වා ඇති උපදෙස්වලට පටහැනිව වැය විෂය අංක 166-2-16-5-2506-0/11 යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනය ඉක්මවා රු.4,622,422 ක බැදීම් ඇති කර ගෙන තිබුණි.

(ආ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදය ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාළ සියලුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළ යුතු අතර කිසිදු බැරකමක් ඊළඟ වර්ෂයට ගෙන නොයා යුතුය. 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.31,779,975 ක් වූ බැරකම් ඇතිකර ගෙන මාස 03 ත් මාස 11 ත් අතර කාලයක් ගත වුවද බැදීම් නිරවුල් කරගෙන නොතිබුණි.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.3 ඡේදය	අමාත්‍යාංශ සේවයේ යෙදී සිට 2022 වර්ෂයේ විශ්‍රාමගත් නිළධාරීන් දෙදෙනෙකුට අයත් එකතුව රු.310,506 ක ණයශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය නොවී පැවතුනි. එමෙන්ම එම නිළධාරීන් විශ්‍රාම ගැනීමට පෙර එම ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ උක්ත පරිච්ඡේදයට අනුව, එහි 23 වැනි පරිශිෂ්ටයේ දැක්වෙන ආකෘතියට අනුව අවලංගු කළ නොහැකි පොරොන්දුවකට අදාල නිළධාරීන්ගෙන් අත්සන් ලබාගෙන නොතිබුණි.
(ආ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචිකර ගැනීමට හෝ ලියාපදිංචිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරා දීමට කටයුතු කළයුතු වුවත්, එසේ නොකර අමාත්‍යාංශය විසින් වෙනත් අමාත්‍යාංශ සතු

වාහන 08 ක් වර්ෂ කිහිපයක සිට භාවිත කරමින් පැවතුණි.

(ඇ)	රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/01 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියේ 3.3 ඡේදය හා 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(iv) ඡේදය	චක්‍රලේඛ විධිවිධානවලට අනුව රාජ්‍ය ව්‍යවසාය අරමුදල්වලින් මිලදී ගත් වාහන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් භාවිතා නොකළ යුතු අතර එසේ පරිහරණය කිරීම සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියක් ලබාගත යුතුය. එහෙත් එවැනි අනුමැතියකින් තොරව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් වාහන 04 ක් වසර 02 කට වඩා වැඩි කාලයක සිට අමාත්‍ය කාර්ය මණ්ඩලයේ පරිහරණයට යොදවා තිබුණි.

2.5 අවිධිමත් ගනුදෙනු

2022 වර්ෂයේ ජල සම්පාදන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය ලෙස පත්කළ සහයක කාර්ය මණ්ඩල නිළධාරීන් 15 දෙනෙකු වෙත ලබාදුන් පත්වීම් ලිපිවලට සහ ඔවුන්ගේ පත්වීම් භාර ගැනීමේ ලිපිවලට අනුව පත්වීමේ දිනය 2022 ජුනි 27 වුවත් 2022 මැයි 24 දින සිට සේවය කළ බවට හේතු දක්වමින් විධිමත් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව එම නිලධාරීන්ට එදින සිට 2022 ජුනි 27 දක්වා කාලපරිච්ඡේදයට අදාළව වැටුප් හා වෙනත් දීමනා ලෙස එකතුව රු.1,402,827 ක් ගෙවා තිබුණි.

2.6 බැංකු ගිණුම් මෙහෙයවීම

2022 සැප්තැම්බර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/12 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය අනුව 2022 සැප්තැම්බර් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය අමාත්‍යාංශය, කැබිනට් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන ඒකකයක් වශයෙන් කටයුතු කළ යුතුය. ඒ අනුව ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට අයත්ව තිබූ ලංකා බැංකුවේ අංක 7042707 දරන නිල බැංකු ගිණුම වසා දමා එහි ගනුදෙනු අත්හිටුවීමට කටයුතු කළයුතුව තිබුණත් එසේ නොකර එම ගිණුම විගණන දිනය වූ 2023 මාර්තු 24 දින වන විටත් පවත්වාගෙන යමින් පැවතුනි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ආසියානු සමුළුවට අදාළ පසු විපරම් කටයුතු හා දීප ව්‍යාප්ත සනීපාරක්ෂක වැඩසටහන යටතේ 2022 වර්ෂයේ යටියන්තොට, දමන, දෙහිඅත්තකණ්ඩිය හා උහන ප්‍රදේශවල ප්‍රතිලාභීන් සඳහා වැසිකිලි 80 ක් ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 10 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම කටයුත්ත කඩිනමින් නිමකර අදාල ප්‍රතිලාභීන්ට එම සේවාව ලබා දීමට නොහැකිවී තිබුණු අතර සමාලෝචිත වර්ෂය නිම වන විට එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙළින් සියයට 85 ක් සහ සියයට 91.5 ක් ලෙස වාර්තා වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් නිදන්ගත වකුගඩු රෝගයෙන් පීඩාවට පත් ප්‍රදේශ ආවරණයවන පරිදි ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යටතේ 2022 වර්ෂය සඳහා ක්‍රියාකාරකම් 22 ක් වෙනුවෙන් රු.මිලියන 10.30 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම ව්‍යාපෘතියට අදාලව රු.මිලියන 3.5 ක් වැය කරමින් පදවිය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ජල සම්පාදන ව්‍යාපෘතියේ ජලනල එලීම, මැණික්සොරොව්ව, පාලන කුටිය ඉදි කිරීම, විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම ආදී කටයුතුවල කිසිදු ප්‍රගතියක් සමාලෝචිත වර්ෂය නිමවන විට වාර්තා වී නොතිබුණි. එමෙන්ම රු.මිලියන 5 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ EDR පිරිපහදු පද්ධතිය සවි කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතියද සියයට 10 ක පමණ අඩු අගයක් ගෙන තිබුණු අතර ඒ සඳහා වෙන්කළ සම්පූර්ණ ප්‍රතිපාදනයම එම පද්ධතිය වරායෙන් නිදහස්කර ගැනීම හා ප්‍රවාහනය වෙනුවෙන් වැය කර තිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය ජල සැපයුම් සහ සනිපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ රු.68,097,893 ක ඇස්තමේන්තු පිරිවැයක් මත මැණික්කඩවර ජල සම්පාදන ව්‍යාපෘතිය 2019 ඔක්තෝම්බර් 24 දින ආරම්භ කර තිබුණි. විගණන දිනය වූ 2023 මාර්තු 02 දින වන විට එම ව්‍යාපෘතියේ කාර්යයන් 14 ක් ඉටු කිරීම වෙනුවෙන් රු.28,530,317 ක් ගෙවා තිබුණද මෙම ව්‍යාපෘතිය අවසන් කළ යුතු කාලය පිළිබඳ නිසි පරිදි සැළසුම් සකස් කර

නොතිබූ අතර එය ආරම්භකර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වර්ෂ 03 ක් ඉක්මගියද එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක් පමණක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජල සම්පාදන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත (දේශීය හා විදේශීය මූලාශ්‍ර තුලින් මූල්‍යයනය මගින් ක්‍රියාත්මක කරන) ව්‍යාපෘති 19 ක් සඳහා එකතුව රු.මිලියන 27.74 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එම ප්‍රතිපාදනවලින් සමස්ථ උපයෝජනය රු.මිලියන 26.85 ක් වී තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කර තිබූ වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රගතියට අනුව ඉහත කී ව්‍යාපෘතිවලින් දින දීර්ඝ කිරීම් ලබාදුන් ව්‍යාපෘති 5 ක් සහ තවත් ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩ නිමකළ යුතුව තිබුණි. එහෙත් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 43 ත් 98 ත් අතර පරාසයක පැවතුනි. ඉන් ව්‍යාපෘති 2 ක මූල්‍ය ප්‍රගතිය සියයට 117 ක් හා සියයට 105 ක් වී තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘති නිම කිරීම සඳහා වූ මූලික සැලසුම් ගත කාලය ඉක්මවා සමාලෝචිත වර්ෂය අවසන් වන විට මාස 04 සිට වර්ෂ 5 ක් දක්වා ප්‍රමාද වී තිබුණි. ඉහත ව්‍යාපෘති 19 න් ව්‍යාපෘති 07 ක වැඩ නියමිත කාලය තුළ නිම කිරීමට නොහැකිව තිබූ අතර ඒවායෙහි වැඩ අවසන් කලයුතු දිනය ඉක්මවා වර්ෂ 4 ½ සිට වර්ෂ 6 ½ ක පමණ කාලයක් දින දීර්ඝ කිරීම් ලබා තිබුණි.

3.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

කැගල්ල පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ එම දිස්ත්‍රික්කයේ ගම්මාන 9 ක් වෙනුවෙන් ජල පහසුකම් සැපයීම සඳහා පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් ජලසම්පාදන මණ්ඩලය වෙත 2022 වර්ෂයේ දී රු.මිලියන 29.77 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 47 ක් හා සියයට 94 ක් වී තිබුණි. පවතින ආර්ථික අපහසුතා සහ ඉන්ධන අර්බුදය හේතුවෙන් ජල සම්පාදන අමාත්‍යාංශය මගින් එම ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණයක් සිදු නොකෙරුණු බව අමාත්‍යාංශ ලේකම් විසින් විගණනයට දන්වා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක වී තිබේද යන්න පිළිබඳ තොරතුරු අනාවරණය නොවුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 751(1) ප්‍රකාරව බඩු ලේඛන පොතෙහි සෑම සටහනක්ම බඩු ලේඛන වවුචරයකින් තහවුරු විය යුතු වුවද, ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020 හා 2021 වර්ෂවල මිලදී ගනු ලැබූ එකතුව රු.10,394,249 ක් වටිනා භාණ්ඩ 259 කට අදාලව බඩු ලේඛන පොතෙහි දිනය හා වවුචර් අංකය ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2022 දෙසැම්බර් 31 දින සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයට අනුව එවකට පැවති ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් අයිතම 38 ක අතිරික්තයක් හා 07 ක ඌණතාවයක් පැවතුනි. මුදල් රෙගුලාසි 804(2)(අ) ජේදයේ සඳහන් පරිදි, ඉහත කී අතිරික්තතා සහ ඌනතා සළකා බලා ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) චීන රජය විසින් ප්‍රදානයක් ලෙස ජල සම්පාදන අමාත්‍යාශය වෙත භාර දී තිබූ රු.39,183,806 (USD 211,142.40) ක් වටිනා ජංගම ජල තත්ත්ව පරීක්ෂණ රථය 2022 දෙසැම්බර් 31 දින දක්වා කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව අමාත්‍යාංශ පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

(ඈ) අමාත්‍යාංශය සතු වාහන 03 ක් ධාවන රාජකාරී සඳහා යොදා නොගෙන මාස 06 ත් වසර 01 ත් අතර කාලයක සිට අමාත්‍යාංශ භූමියේ නිශ්ක්‍රීයව ගාල් කර තිබෙන බව නිරීක්ෂණය විය.

3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ වාහන 04 කට අවස්ථා 05 කදී සිදු වී තිබූ අනතුරු සම්බන්ධයෙන් අදාල අනතුරු සිදු වී වසර 01 ත් 05 ත් අතර කාලයක් ගත වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(1),104(3) හා 104(4) රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඊට අදාළ එකතුව රු.492,280 ක් වූ අලාභ සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් වෙත ලබා දී තිබූ තක්සේරු වටිනාකම රු.12,000,000 ක් වූ වාහනයක් 2022 මැයි 09 වන දින සිට රාජ්‍ය අමාත්‍යාංශය අහෝසිවීමෙන් පසු 2022 ජුනි 20 දින අමාත්‍යාංශට භාර දී තිබුණු අතර එහිදී එම වාහනය අනතුරට ලක්වී තිබූ බව හඳුනාගෙන තිබුණි. ඒ පිළිබඳව නියමිත කාලය තුල පොලීසිය හා රක්ෂණ ආයතනය දැනුවත් කර නොතිබීම හේතුවෙන් අනතුරට අදාල ඇස්තමේන්තුගත අළුත්වැඩියා වියදම වූ රු.572,700 ක ගෙවීම රක්ෂණ ආයතනය ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර ඉහත කී පරිදි රජයට සිදුවී ඇති පාඩුවට වගකිවයුතු අය හඳුනාගෙන අයකර ගැනීමට 2023 මාර්තු 27 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) රාජකාරී කටයුතු වෙනුවෙන් අමාත්‍ය කාර්යාලයට ලබා දී තිබූ රු.1,387,192 ක වටිනාකමින් යුතු කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රයක් හා ලැප්ටොප් පරිඝනකයක් අමාත්‍යාවරයාගේ දේශපාලන කාර්යාලයේ තිබී 2022 මැයි 09 දින රටේ ඇති වූ කලබල හේතුවෙන් විනාශ වූ බව 2022 නොවැම්බර් 22 දිනැති ආරච්චිකට්ටුව පොලිස් ස්ථානාධිපති (වැ.බ) ගේ ලිපිය මගින් අමාත්‍යාංශය වෙත දන්වා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104(1) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමටත් පරීක්ෂණ ආරම්භ කිරීම සඳහා මුදල් රෙගුලාසි 103(1)(අ) ප්‍රකාරව අවශ්‍යතැන්හි නැතිවීම් හෝ හානිවීම් අදාළ බළධාරීන් වෙත වාර්තා කළ යුතු වුවත් එසේ නොකර එම විනාශය සිදු වී දින 196 කට පසු පොලිසියට පැමිණිලි කර තිබුණු බව පොලිස් වාර්තාවට අනුව අනාවරණය විය. එමෙන්ම එම සිද්ධිය පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදුකර වගකිවයුත්තන් හඳුනා ගැනීමට තවදුරටත් නොහැකි වී තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් සේවකයින්ගෙන් හා ආයතනයෙන් අයකර ගන්නා මුදල් නොපමාව අදාල ආයතනය වෙත යැවිය යුතු වුවත්, විගණන නියැදි පරීක්ෂාවට ලක්වූ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ 2022 වර්ෂයේ අප්‍රේල්, මැයි, ජුනි මාසවලට අදාල අරමුදල් ප්‍රේෂණය කිරීම මාසයකට වඩා වැඩි ප්‍රමාදයකින් පසුව සිදු කර තිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2021 දෙසැම්බර් 24 දිනැති කළමණාකරන විගණන චක්‍රලේඛ අංක DMA/01-2019(1) හි 03 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැළැස්ම සඳහා විගණන හා කළමණාකරණ කමිටු අනුමැතිය ලබාගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 01 ක් හා ද්විතියික මට්ටමේ තනතුරු 06 ක අතිරික්තයක් නිරීක්ෂණය

විය. එමෙන්ම එදිනට අනුමත කාර්ය මණ්ඩලය තුළ රියදුරු තනතුරු 14 ක් පැවති අතර තත්‍ය කාර්ය මණ්ඩලය 10 ක් වූයෙන් එම තනතුරෙහි 04 ක ඌනතාවයක් දක්වා තිබුණද ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙතින් ලබාගත් රියදුරන් 07 ක්ද අමාත්‍යාංශයේ සේවයේ යොදවා ඇති බැවින් රියදුරන් 03 ක අතිරික්තයක් නිරීක්ෂණය විය.

(ආ) ජල සම්පාදන අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල තනතුරු සඳහා අනියම් හා කොන්ත්‍රාත් පදනමින් 2022 වර්ෂයේ බඳවා ගනු ලැබූ සහයක කාර්යය මණ්ඩල නිළධාරීන් 15 දෙනා, රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.2 ඡේදය ප්‍රකාරව රජයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිළධාරීන් බව තහවුරු කර ගැනීමට අදාල තොරතුරු ලිපිගොනු තුල නොතිබුණි.

(ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ 2010 මැයි 14 දිනැති සීඒ/1/17/1 දරන ජනාධිපති කාර්යාල ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය උපරිමය 15 නොඉක්මවිය යුතු වුවද 2022 මැයි 24 දින වන විට අමාත්‍ය කාර්ය මණ්ඩලය ලෙස නිලධාරීන් 18 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

එම්.ඒ.එස්.පුෂ්පරාණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.